**ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය**

**කොළඹ**

*******

**<u>පුවත්පත් නිවේදනය</u>**

## ලඩාක් සහ ජම්මු සහ කාශ්මීර් : වසරක පෙර නොවූ විරූ සංවර්ධනය

නේහා සිං, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ ප්‍රකාශක

පසුගිය වසර ලඩාක් සහ ජම්මු සහ කාශ්මීර පාලන ප්‍රදේශ සඳහා ඉතා වැදගත් වසරක් විය. විදේශයන් විසින් පනවා තිබූ දශක හතක ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පීඩාවට පත්ව සිටි ජනතාවට සංවර්ධනය සහ නිසි පාලනයක් ලබා දීම පෙර ජම්මු සහ කාශ්මීර ප්‍රාන්ත ප්‍රතිසංවිධානය කිරීම වෙනුවෙන් බිලියන 1.3ක ඉන්දියානු ජනතාවක් නියෝජනය වන පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලය විසින් ගත් සුවිශේෂී තීරණයේ මූලික අරමුණ විය.

මේ අනුව 2019 අගෝස්තු 5 වන දින ඉන්දියානු පාර්ලිමේන්තුව පෙර ජම්මු සහ කාශ්මීර ප්‍රාන්තය විසින් 1948 වසරේදී ස්වකැමැත්තෙන් ඉන්දියාවේ කොටසක් වුවද ජාතික ප්‍රධාන ධාරාවෙන් ඈත් කරන ලද යල් පැන ගිය සහ වර්තමාන තත්වය පිළිඹිබු නොකරන ව්‍යවස්ථා ප්‍රතිපාදන අහෝසි කිරීමට තීරණය කළේය. මෙම ප්‍රතිපාදන සුළු පිරිසකගේ ආත්මාර්ථය පදනම් කරගත් දේශපාලනයටද පවුල් පාලනයටද අවස්ථාව ලබා දෙමින් ප්‍රාන්තයේ ජනතාවගේ සංවර්ධන අභිලාශයන් මුවා කර තිබිණ. ජම්මු සහ කාශ්මීර ප්‍රාන්තය පසුව ලඩාක් සහ ජම්මු සහ කාශ්මීර යනුවෙන් පාලන ප්‍රදේශ දෙකකට ප්‍රතිසංවිධානය කරන ලද අතර ඒවායේ පාලන තන්ත්‍රය ඉන්දීය රජයේ ඍජු වගකීමක් බවට පත් කරන ලදී. එය සම්පූර්ණයෙන්ම ඉන්දියාවේ අභ්‍යන්තරික තීරණයක් විය. ඉන්දියාවේ බාහිර දේශ සීමා වෙනස් නොවුණු අතර එසේ වෙනස් කිරීමටද අපේක්ෂා නොකෙරිණ.

ප්‍රධානතම බෞද්ධ ආධ්‍යාත්මික මධ්‍යස්ථානයක් සහ ප්‍රසිද්ධ සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රචලිත ලඩාක් පාලන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම වහාම ශ්‍රී ලංකාව ඇතුළු රටවල් සාදරයෙන් පිළිගන්නා ලදී. මෑතකදී, ලඩාක්හි ප්‍රථම මධ්‍යම විශ්ව විද්‍යාලය පිහිටුවීම සඳහා වන සැලසුම අනුමත වූ අතර එහි බෞද්ධ අධ්‍යයන කටයුතු සඳහා මධ්‍යස්ථානයක්ද පිහිටුවීමට නියමිතය. හිමාලය ආශ්‍රිත ලඩාක් සහ ජම්මු සහ කාශ්මීර පාලන ප්‍රදේශයන්හි සංවර්ධනයේ සහ පාලනයේ වැදගත් ජයග්‍රහණ ඉන්දියාවේ මෙම අත්‍යන්ත සහ අවියෝජනීය ප්‍රදේශයන්ට සැබවින්ම සුදුසු වනු ඇත.

ජම්මු සහ කාශ්මීර පාලන ප්‍රදේශයේ සැබෑ තත්වය අපක්ෂපාතීව අධ්‍යයනය කරන විට පිළුණු අතීතයෙන් ඈත් වීම සාධාරණීකරණය කළ හැකි පමණක් නොව දැඩිව අවශ්‍යව තිබූ බව පෙනී යයි. ඉන්දියානු ප්‍රජාතන්ත්‍රවාදය විසින් ගනු ලැබූ නිර්භීත තීරණයේ ප්‍රතිඵලයක් ලෙස ඉන්දියාවේ උතුරටම වන්නට පිහිටි කලාපය තුළ අධිරාජ්‍යවාදය විසින් ඉන්දියානු අර්ධද්වීපයේ සිය අණසක ලිහිල් කිරීමෙන් වසර 70කට අධික කාලයට පසු සෑම මිනිස් ක්‍රියාකාරකමක්ම පෙර නොවූ විරූ ප්‍රගතියක් පෙන්නුම් කරයි.

කලාපයේ ආර්ථිකයේ සීඝ්‍ර දියුණුව සහ සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම පසුගිය වසරේ වඩාත්ම කැපී පෙනෙන ජයග්‍රහණ අතර වේ. ජම්මු සහ කාශ්මීර පාලන ප්‍රදේශයේ රජය විසින් ගෝලීය ජාත්‍යන්තර සමුළුවක් සඳහා ප්‍රථම වරට පූර්ව සමුළුවක් සංවිධානය කරන ලද අතර, එහිදී අවධානය යොමු වූ අංශ 14 ක, ප්‍රතිපත්ති හා නියාමන රාමුව මෙන්ම ආයෝජන අවස්ථා ඉස්මතු කෙරිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සහ ඉන්දියාව පුරා සංවිධානය කරන ලද මාර්ග සංදර්ශනවල සහාය ඇතිව, ඉන්දියානු රුපියල් කෝටි 13,600 ක් (ඇමරිකානු ඩොලර් බිලියන 1.9 ක් පමණ) වටිනා අවබෝධතා ගිවිසුම් 170 කට ආසන්න සංඛ්‍යාවක් අවසන් කරන ලදී.

තවත් උදාහරණයක් දැක්වුවහොත්, දිළිඳු කාශ්මීර ඇපල් ගොවීන් ඉලක්ක කර ගනිමින් ඉන්දියාවේ දේශසීමා හරහා ත්‍රස්තවාදයට සහාය සහ අනුග්‍රහය ලබා දීම සැලකිල්ලට ගෙන, රජය විසින් මෙම ඇපල් මිලදී ගැනීම සඳහාම වෙන්වූ යෝජනා ක්‍රමයක් සංකල්පනය කොට ක්‍රියාත්මක කරන ලදී. මේ වසරේ ජනවාරි අවසානය දක්වා මාස 5 කටත් අඩු කාලයක් තුළ, ඉන්දියානු රුපියල් කෝටි 70 කට (ඇමරිකානු ඩොලර් මිලියන 10 ක් පමණ) වඩා වටිනාකමින් යුතු ඇපල් මෙට්‍රික් ටොන් 15,000 කට වැඩි ප්‍රමාණයක් කාශ්මීර නිම්නයේ ගොවීන්ගෙන් සෘජුවම මිලදී ගන්නා ලදී. එය සිදු කරන ලද්දේ ත්‍රස්තවාදීන් එම ගොවීන්ට වෙඩි තබමින් ඔවුන්ව බිය ගන්වමින් සිටි පසුබිමකය. ඉන්දියානු මෛත්‍රී වර්ණයට සහ ලොව පුරා සිටින නිවැරදි චින්තනයක් සහිත ජනයාට ආලෝකය හා අභිමානය එක් කළ තවත් පියවරක් ලෙස මීටර් 1600 ත් 1800 ත් අතර උන්නතාංශයක වගා කරන ලද කාශ්මීර කුංකුම සඳහා භූගෝලීය දර්ශක සංකේතය (Geographical Indication tag) ලබා දෙන ලදී.

මුළු රටේම අධිෂ්ඨානය පිළිබිඹු කරමින් ඇමතිවරු 36 දෙනෙක් පාලන ප්‍රදේශයේ ස්ථාන 50 කට වැඩි ගණනකට ගොස් එහි යථාර්ථයන් ඔවුන් විසින්ම අසා, දැක බලා ගැනීමටත් ව්‍යාපෘති 200 කට අධික සංඛ්‍යාවක් ආරම්භ කිරීමටත් කටයුතු සිදු කරන ලදී. නාගරික හා ග්‍රාමීය යටිතල පහසුකම් නවීකරණය කිරීම, සැමට විදුලිය ලබා දීම සහ ගංවතුර අවම කිරීම සඳහා කටයුතු කිරීමට අවශ්‍ය ශක්තිමත් ව්‍යාපෘති ඉදිරියට ගෙන ගොස් ඇත. මාර්ගගත (ඔන්ලයින්) කෘෂිකාර්මික වෙළඳපොළ වේදිකාවක් සහ රටේ ප්‍රථම වතාවට ශීත සෘතු ක්‍රීඩාවලියක් පසුගිය වසරේ දී ජම්මු හා කාශ්මීර කලාපයේ පැවැත්විණ.

පසුගිය වසරේ නොවැම්බරයේ දියත් කරන ලද ''ආපසු ගමට'' නම් සුවිශේෂී වැඩසටහනක් තුළින් රජයේ නිලධාරීන් පාලන ප්‍රදේශයේ ඉතා ඈතින් පිහිටි ප්‍රදේශවලට ගොස් සංවර්ධන

අවශ්‍යතා අධ්‍යයනය කිරීම සඳහා දින දෙකක් සහ එක් රාත්‍රියක් ගත කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, සංවර්ධන අවශ්‍යතා 20,000 කට වැඩි ප්‍රමාණයක් ජනතාව විසින් හඳුනා ගන්නා ලද අතර මෙයින් තුනෙන් එකකට වඩා (7000) වැඩි ප්‍රමාණයක් දැනටමත් ක්‍රියාත්මක කර ඇත.

මෙම ප්‍රයත්නයන් ඒකාබද්ධ කිරීම සඳහා ධනාත්මක පියවර සහ රජයේ රැකියා අවස්ථා ලබා දීමේදී විනිවිදභාවයකින් යුක්තව කටයුතු කිරීම හඳුන්වා දී තිබේ. ලෝ ප්‍රකට Indian Institutes of Technology ජම්මු සහ කාශ්මීරයේ අවසාන වසර සිසුන්ට රැකියා පුහුණු අවස්ථා ලබා දීමට ඉදිරිපත්ව තිබේ. එසේම, නව සොයාගැනීම්, නවෝත්පාදන, නව ව්‍යාපාර බිහි කිරීම සහ පුහුණු කිරීම සඳහා  මධ්‍යස්ථාන දෙකක් පිහිටුවීම මගින් කර්මාන්ත සහ අධ්‍යාපන ක්ෂේත්‍රය අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීමට සැලසුම් කර ඇත.

අනාගතය පිළිබඳව තවදුරටත් අවධානය යොමු කරමින්, නිෂ්පාදන පර්යේෂණ, සංවර්ධනය සහ අලෙවිකරණය සඳහා තෝරාගත් ආරම්භක අවස්ථාවේ පවතින ව්‍යාපාර 12 ක් සඳහා පළාත් පාලන රජය විසින් රුපියල් කෝටි 1.2 ක් ලබා දී ඇත. ජම්මු සහ ශ්‍රී නගර්හි එක් තොරතුරු තාක්ෂණ උද්‍යානය බැගින් තොරතුරු තාක්ෂණ උද්‍යාන දෙකක් ද පිහිටුවීමට සැලසුම් කර ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රයේ, පුරප්පාඩු 25,000 ක් සහිත නව ආයතන 50 ක් ස්ථාපිත කර ඇත. මෙය දශක හතකින් පසුව ජනනය කරන ලද වැඩිම රැකියා සංඛ්‍යාව ලෙස සැලකේ. ඉන්දියානු රුපියල් කෝටි 7,500 ක් (ඇමරිකානු ඩොලර් බිලියනයකට වඩා වැඩි) වටිනා නව සෞඛ්‍ය යටිතල පහසුකම් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර එයට ජම්මු හි විජයපූර් සහ කාශ්මීරයේ අවන්තිපුරාහි නව සමස්ත ඉන්දීය වෛද්‍ය විද්‍යා ආයතන දෙකක්, නව වෛද්‍ය විද්‍යාල 7 ක්, නව හෙද විද්‍යාල පහක් සහ රජයේ පිළිකා ආයතනයක් ඇතුළත් වේ.

කැපී පෙනෙන තවත් ජයග්‍රහණයක් වන්නේ යටිතල පහසුකම් සංවර්ධනයයි. අග්‍රාමාත්‍යවරයාගේ සංවර්ධන පැකේජය යටතේ විවිධ අංශවල පැතිර තිබෙන ව්‍යාපෘති සඳහා ඇති බාධක ඉවත් කර ඇත. රුපියල් කෝටි 7000 ක් වටිනා ව්‍යාපෘති 190 ක් සමඟින් මෙහි අරමුණ වන්නේ ජම්මු සහ ශ්‍රී නගර් සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතිය වැනි පහසුකම් හා නිවාස, මුඩුක්කු සංවර්ධන පුනරුත්ථාපන හා නගර ප්‍රතිපත්ති වලින් සමන්විත නවීන, තිරසාර හා සුහුරු නගර ලෙස සංවර්ධනය කිරීමයි. ජම්මු හා කාශ්මීර ඒකාබද්ධ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සංක්‍රාන්ති ලිංගිකයින් ප්‍රථම වරට ප්‍රතිලාභීන් ලෙස ඇතුළත් කරන ලදී. ජම්මු හා කාශ්මීරය එක් ජාතියක් එක් සලාක කාඩ්පත් ක්‍රමයක් දියත් කිරීමේ පළමු අදියර සම්පූර්ණ කළේය.

සමාජ ආර්ථික සංවර්ධනයේ ප්‍රගතිය සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයේ සියලු වැදගත්  අංශයන් තුළ පරිපාලනයේ සහ ජම්මු හා කාශ්මීර ජනතාවගේ  අවංක පියවර සමගින් ගලපා ඇත.

සංවර්ධන කවුන්සිල අවහිර කිරීම සඳහා ප්‍රථම වතාවට, පංචායත් රාජ්‍ය ආයතනවල දෙවන ස්ථරය (පහලම පාලන ස්ථරය) පසුගිය වසරේ ඔක්තෝම්බර් මාසයේදී පැවැත්විණ. පෙර

නොවූ විරූ ලෙස 98% ක ඡන්ද ප්‍රතිශතයක් ඔවුන් ලබා ගත්තේය. කාන්තාවන්, ළමුන්, වරප්‍රසාද නොලත් කොටස්වල සමාජ, ආර්ථික හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ විනිවිද පෙනෙන හා වගකිවයුතු පාලනය සහතික කිරීම ඇතුළු සියලු මධ්‍යම නීති පාලන ප්‍රදේශයට ලබා දී ඇත.

පංචායත් සඳහා ආධාර කිරීම වෙනුවෙන් ඉන්දියානු රුපියල් කෝටි 1500 කට වැඩි මුදලක් ලබා දෙන ලදී. දුක්ගැනවිලි විසඳීම ශක්තිමත් කිරීම සඳහා සෑම පංචායතයකම ඒ සඳහාම වෙන්වූ පෙට්ටි තබා ඇත.

ජම්මු හා කාශ්මීර පාලන ප්‍රදේශය එවැනි සවිබලගැන්වූ වාතාවරණයක් තුළ ජයග්‍රහණ ගණනාවක් ලබා තිබීම පුදුමයක් නොවේ.

සවිබල ගැන්වීමේ රාමුවට සහ ජාතික සම්පත් වෙත ප්‍රවේශය තිබීම හේතුවෙන් කොවිඩ්වසංගතයට එරෙහි සටන තරම් භයානක හා පෙර නොවූ විරූ අභියෝගයක් හමුවේ වුවද, ජම්මු හා කාශ්මීරය ඉන්දියාවේ හොඳම ක්‍රියාකාරී ප්‍රාන්තයන්/ පාලන ප්‍රදේශයන් අතර වේ. එහි කොවිඩ් පරීක්ෂණ අනුපාතය ජාතික සාමාන්‍යයට වඩා සිව් ගුණයක් පමණ වේ. කොවිඩ් -19 සඳහාම වෙන්වූ රෝහල් පිහිටුවන ලද පළමු ප්‍රාන්ත/ පාලන ප්‍රදේශ අතර ජම්මු හා කාශ්මීරය ද විය. කොවිඩ්-19 ට මුහුණ දීම සඳහා මනා පිළිවෙත් අනුගමනය කිරීමට තෝරාගත් දිස්ත්‍රික්ක 16 අතරට ශ්‍රී නගර් ද ඇතුළත් විය. සංචාරක අංශයට, ව්‍යාපාරයට මෙන්ම ඉදිකිරීම් කම්කරුවන්ට ද ආධාර කිරීම සඳහා මධ්‍යම රජය ඉන්දියානු රුපියල් කෝටි 350 ක (ඇමරිකානු ඩොලර් මිලියන 50) සහන පැකේජයක් අනුමත කළේය.

පසුගිය වසරක අත්දැකීම් වලින් පෙනී යන්නේ පාලන ප්‍රදේශයේ ජනතාව සහ රජය ඔවුන්ගේ ජයග්‍රහණ වලින් සෑහීමකට පත් නොවන බවයි . ඉන්දියාවේ දේශසීමා හරහා දිගින් දිගටම සෘණාත්මක ප්‍රචාරයන් දියත් කිරීම සහ ත්‍රස්තවාදයට සහයෝගය දැක්වීම නොසලකා, ඉන්දියාවේ සෙසු ප්‍රදේශ සමඟ පියවරෙන් පියවර සංවර්ධනය, සාමය සහ සමෘද්ධිය කරා යන ගමනේ යෙදීමටත්, ඔවුන්ගේ අනෙක් ඉන්දියානු සහෝදර සහෝදරියන් සමඟ උරෙනුර ගැටී කටයුතු කිරීමටත් ඔවුන් අධිෂ්ඨාන කරගෙන සිටී.

සමූහ ප්‍රචණ්ඩත්වය සහ ත්‍රස්තවාදය සිදුකරන සහ ප්‍රවර්ධනය කරන අයට ජනතාවගේ හඬට අවනත විය හැකි නම්, සත්‍ය කරුණු වලට ඇහුම්කන් දිය හැකි නම්, ඔවුන්ගේ නීති විරෝධී හා බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින භූමිය තුළ මේවා එලෙසම ක්‍රියාත්මක කිරීමට සදාචාරාත්මක ධෛර්යයක් තිබේ නම් කොපමණ අගනේද? !

***

කොළඹ

2020 අගෝස්තු 03